පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 79

ආයතනයේ නම :- මහජන ආරක්ෂක අමාත්‍යාංශය

අ. අං	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	නිවරදි කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය
01	මු.රෙ.134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙළ කර නොතිබුණි.	අදාළ කාල වකවානුව තුළ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති අතර අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක වී නොමැත. වර්තමානය වන විට ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙළ කර ඇත.
02	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 වසරේ යම් ප්‍රමාදයක් පැවතියද ඉන්පසුව නියමිත කාලවකවානු තුළ අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.
03	සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත	CAT - 7887, අංක KJ - 7739 අංක PF-7403 අංක PF - 7336, අංක CAC - 1724, අංක CAQ - 1754 හා අංක KY – 3614 දරණ රථයන් එවකට පළාත් පළාත් පාලන අමාත්‍යාංශය සතු වාහන වන අතර 2020 වර්ෂයේදී මෙම අමාත්‍යාංශය භාරව සිටි අමාත්‍යවරයා වන අමාත්‍ය සරත් වීරසේකර මහතා මෙම අමාත්‍යාංශයේ රාජකාරී භාර ගැනීමේදී එතුමා හා කාර්යය මණ්ඩලය සඳහා එම අමාත්‍යාංශයේ සිට රැගෙන එන ලද වාහන වේ. වර්තමානයේ ගරු මහජන ආරක්ෂක අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය සඳහා ද එම වාහන ලබා දී ඇති බැවින් එම වාහන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය නැවත එම අමාත්‍යාංශය වෙත භාර දෙන ලෙස ඉල්ලීම් කර ඇති නමුත් අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා ලබා දීමට මෙම අමාත්‍යාංශය සතුව වාහන නොමැති බැවින් ඒවා නිදහස් කළ නොහැකි වී ඇත. එසේම එම වාහන මෙම අමාත්‍යාංශය වෙත පැවරීමට ද රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය එකඟතාවය පළකර නොමැත. ඉහත අංක දක්වා ඇති රථ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලබා දීම සඳහා ඒ වෙනුවට මෙම අමාත්‍යාංශයට රථයන් ලබා දෙන ලෙස කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ලිපි යොමු කර ඇත. ශ්‍රී ලංකා පොලිසිය සතු අංක ABV – 1283 ත්‍රිරෝද රථය හා අංක CBM - 2541 ජීප් රථය මෙම අමාත්‍යාංශය වෙත තාවකාලිකව පවරා ඇත. වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය සතු අංක KO - 8807 දරන රථය මෙම අමාත්‍යාංශයට ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත. මෙයට අමතරව අනෙකුත් සියළුම වාහන වල අයිතිය තහවුරු කරන ලිපි මෙම අමාත්‍යාංශය සතුව ඇත.

04	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මෙම අමාත්‍යාංශයට අයත් සංචිත වාහන වල රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනය කර ඇත.
05	වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි	මෙම අමාත්‍යාංශයේ ගර්හිත වූ වාහන නොමැත.
06	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	මේ වන විට මෙම අමාත්‍යාංශය භාවිතා කරන සියලුම වාහන සඳහා නිසි පරිදි යාවත්කාලීන කරන ලද ලොග් සටහන් පොත් පවත්වා ගෙන යනු ලබයි.
07	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන් කර ඇත.	නියමිත කාල වකවානු ඇතුලත ප්‍රතිපාදන නිකුත් කළද හිඟ ප්‍රතිපාදනයක් වෙතොත් පමණක් නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන නිකුත් කර ඇති අතර එවැනි අවස්ථා අවම කිරීම සඳහා ඉතාමත් නිවරදි ආකාරයෙන් ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන ලබා ගන්නා ලෙස අදාල ආයතන/නිලධාරීන් දැනුවත් කර ඇත.
08	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2022.12.31 දිනට පැවති හිඟ ණය ශේෂය රු. 389,850 වන අතර 2024.06.30 දිනට හිඟ ණය ශේෂය රු. 297,480 වේ. එම හිඟහිටි ණය ශේෂයද කඩිනමින් අය කිරීමට කටයුතු කරනු ලබයි. (ඇමුණුම 01)
09	අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	මෙම අමාත්‍යාංශය සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ සංවර්ධන නිලධාරී තනතුරු 40 ක් හා කලමනාකරණ සේවා නිලධාරී තනතුරු 30 ක් අනුමත වී ඇත. නමුත් මේ වන විට සංවර්ධන නිලධාරීන් 42 ක් හා කළමනාකරණ සේවා නිලධාරීන් 22 ක් සේවයෙහි යෙදී සිටී. ඒ අනුව කළමනාකරණ සේවා නිලධාරී තනතුරු 8 ක් පුරප්පාඩුව ඇති අතර සංවර්ධන නිලධාරී තනතුරු 02ක් අතිරික්තව පවතී. නමුත් 2024.06.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 (IV) හි 2.6 ඡේදයේ සඳහන් කර ඇති ආකාරයට දේශීය හා විදේශීය නිවාඩු ලබා ඇති නිලධරයන් පුරප්පාඩු ලෙස සලකා ඉදිරි කටයුතු කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව මෙම අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරීන් 39 ක් හා කලමනාකරණ සේවා නිලධාරීන් 20 ක් මේ වන විට සේවය කරන අතර අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගෙන නොමැත. ඒ බව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වමින් ලිපියක්ද යොමු කර ඇත.
10	2017.09.20 දිනැති 2017 අංක 4 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	2024.01.01 දින සිට 2024.03.31 දින දක්වා වූ කාර්තු වාර්තාව හා 2024.04.01 දින සිට 2024.06.30 දින දක්වා වූ කාර්තු වාර්තාව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

11	ආයතයේ පවත්වා ගෙන යන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි	පූර්ණ ලෙස මෙම අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන 118 ජාතික සේවා මැදිරිය වෙත මාර්ගගතව (Online) පැමිණිලි ඉදිරිපත් කළ හැකි වන සේ යොමුවක් වෙබ් අඩවියේ ඇතුලත් කර ඇත. මෙම යොමුව භාවිතයෙන් 2022.09.22 දින සිට මේ වන තුරු පුද්ගලයින් 10946 දෙනෙකු විසින් පැමිණිලි ඉදිරිපත් කර ඇත.එම පැමිණිලි අදාළ ආයතන වෙතට යොමු කර විසඳුම් ලබා දීම හෝ පැමිණිලි, යෝජනා අනුව ඉදිරි කටයුතු සැලසුම් කෙරේ. ලැබෙන පැමිණිලි සියල්ල පසු විපරම් කර අවශ්‍ය විසඳුම් ලබා දීමට ක්‍රියා කෙරේ. මේ වන විට ආයතනය පිළිබඳව මහජනයාට පැමිණිලි හා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා යොමුවක් වෙබ් අඩවියෙහි ඇතුලත් කිරීමට කටයුතු සිදුකෙරමින් පවතී.
12	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2022 වර්ෂය සඳහා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා රු.500000.00 ක මුදලක් පුහුණු වැඩසටහන් සඳහා වෙන් කර තිබූ අතර එවකට පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් නොපැවැත්වීම, සංවිධානයකර තිබූ පුහුණු වැඩසටහන් කල්දැමීම සහ කණ්ඩායම්ගත පුහුණු වැඩසටහන් අවලංගු කර තිබීම හේතුවෙන් සංවිධානය කර තිබූ පුහුණු වැඩසටහන් පැවැත්විය නොහැකි විය. එබැවින් සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.
13	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය “යටත්ව මට්ටමේ” වන අතර එයට බලපෑ ප්‍රධාන හේතුව අමාත්‍යාංශයේ හා විශේෂ කාර්ය බලකායේ මූල්‍ය නොවන වත්කම් වල පවතින ආරම්භක ශේෂ ගැටළුව වන අතර එය සිගාස් පද්ධතියේ පවතින තාක්ෂණික ගැටළු වන බැවින් ඒවා නිරාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව මෙන්ම වාචිකව දන්වා ඇත.

නම	තනතුර	සේවය හැරගිය වර්ෂය	ණය වර්ගය	2022.12.31 දිනට ශේෂය (රු.)	2023.12.31 දිනට ශේෂය (රු.)	2023.06.30 දිනට ශේෂය (රු.)	2022.12.31 සිට 2024.06.30 දිනට ප්‍රගතිය (රු.)	2022.12.31 සිට 2024.06.30 දිනට ප්‍රගතිය (%)
ගොතටුව	පො.කො. 30454	2003	දේපල	138,085	100,085	70,085	68,000	49%
බණ්ඩාර	පො සැ. 6770	2010	ආපදා	18,128	11,078	7,078	11,050	61%
වික්‍රමසිංහ	පො.කො. 53503	2013	ආපදා	15,450	7,630	2,130	13,320	86%
ස්වර්ණතිලක *	පො.සැ. 24021	2004	දේපල	218,187	218,187	218,187	0	0%
මුළු වටිනාකම				389,850	336,980	297,480	92,370	23%

*ස්වර්ණතිලක නිලධාරියාට විරුද්ධව කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇති අතර ඊළඟ නඩු දිනය 2024.08.29 වේ.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 79
ආයතනයේ නම :- ශ්‍රී ලංකා පොලිසිය

අ. අං	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	නිවරදි කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය
01	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	ප්‍රමාදයන් මග හරවා ගෙන ඇති අතර 2022 වර්ෂයේ සියලුම විගණකාධිපති විමසුම් සඳහා පිළිතුරු සපයා ඇත. එසේම 2023 වර්ෂයේ දී විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා ඇත.
02	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	ප්‍රමාදයන් මග හරවා ගැනීමට කටයුතු කර ඇත.
03	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයට අදාළව ශ්‍රී ලංකා පොලිසියට අයත් සියළු ස්ථානවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. 2022 වර්ෂයේ දී භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේ දී සිදු වූ ප්‍රමාදයන් මග හරවා ගැනීමට කටයුතු කර 2023 වර්ෂයේ දී භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සිදු කර ඇත.
04	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ,ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ,ඌනතා පිළිබඳව වන නිර්දේශයන් ක්‍රියාත්මක කර ඇත.
05	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	2002.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 01/2002 අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/92 මගින් දක්වා ඇති නිලධාරීන් සඳහා අනුයුක්ත කර ඇති වාහන හැර, අනෙකුත් වාහන සඳහා දෙපාර්තමේන්තු නාමය සටහන් කිරීමට කටයුතු කර ඇත.
06	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ .ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2022.12.31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශන වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ හඳුනා ගෙන මේ වන විට නිරවුල් කර ඇත.

07	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2022.12.31 දිනට නිලධාරීන් 1772 දෙනෙකුගෙන් අය විය යුතු හිඟ හිටි ණය ශේෂය රු.42,485,814 ක් වූ අතර 2024.05.31 දින වන විට නිලධාරීන් 310 දෙනෙකුගෙන් රු.7,122,927 ක් අය කර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි ණය ශේෂයෙන් තව දුරටත් අය කර ගත නොහැකි ණය ශේෂය වන, රු.9,074,954ක් වූ ණය ශේෂ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව කපා හැරීම සඳහා ගොනු ඉදිරිපත් කර ඇත. ඒ අනුව තව දුරටත් අය කර ගැනීමට ඇති ණය ශේෂය වන රු.35,362,887.ක මුදල අයකර ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතී.
08	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2021.12.31 දිනට වසර 02ක කාලය ඉක්මවා තිබූ තැන්පත් ගිණුමේ ශේෂය රු.232,581,722ක් වූ අතර එම තැන්පතු ශේෂයෙන් රු.202,093,403 ක මුදලක් 2024.06.30 දින වන විට නිරවුල් කර ඇති අතර එදිනට නිරවුල් කිරීමට ඇති මුදල වන රු.30,488,319 සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීමට ක්‍රියා මාර්ග ගෙන ඇත.
09	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2022 වර්ෂයේ ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විගණන මතයක් නොවන අතර තත්ත්වාගණනය කළ විගණන මතයකි.
10	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අංක PSC/EST/05-04-63/01/2022 හා 2022.06.17 දිනැති ලිපිය මගින් අනුමත කර ඇති ශ්‍රී ලංකා පොලිසියේ ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කර ඇති 2022.09.08 දිනැති අංක 2735/2022 දරණ පොලිස්පති චක්‍රලේඛය මගින් ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන්ගේ ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කර ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 79

ආයතනයේ නම :- ආගමන විගමන දෙපාර්තමේන්තුව

අනු අං.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	නිවරදි කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය
	පළමු කොටස	
01	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත්කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීමේ ප්‍රමාදයක් සිදුවී තිබුනද ඉදිරියේදී නියමිත කාලය තුල විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කරන බව දන්වමි.
02	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2023 වර්ෂයේ සිට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වේ.
03	සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත..	දෙපාර්තමේන්තුව සතු වාහන වලින් එක් වාහනයක් හැර අනෙකුත් සියළුම වාහන දෙපාර්තමේන්තුව සතු වේ. මුදල් අමාත්‍යාංශය මඟින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති NB-6469 දරණ වෑන් රථය දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට සිහිකැඳවීම් කිහිපයක් යවා ඇත.
04	සියලු වාහනවල රජයේ ලාංඡනය පින්තාරු කර නොතිබුණි	මෙම දෙපාර්තමේන්තුව සතු සියලුම වාහන ආගමික හා විගාමික නීති උල්ලංඝණය කරන විදේශිකයන් අත්අඩංගුවට ගැනීම් සහ විමර්ශන කටයුතු සඳහා අවස්ථානුකූලව යොදවන බැවින් මෙම වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රා කිරීම මඟින් එම විමර්ශන කටයුතු සඳහා මහත් ගැටළු එල්ල වේ. තවද මේ වන විට සියලුම වාහනවල දෙපාර්තමේන්තු නම සහිත බෝඩ් ඉදිරියට පෙනෙන ආකාරයෙන් රථයේ ඉදිරිපස වීදුරුව ඇතුලතින් තබා ඇත.
05	වාහනයක් ගර්හිත වී මාස 8කට අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	වර්තමානයේ දෙපාර්තමේන්තුව තුල ගර්හිත වාහන නොමැත.
06	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් කටයුතු කර ඇති අතර මේ වන විට මු.රෙ. ප්‍රකාරව කටයුතු කර ඇත.

<table>
<tr><td>07</td><td>වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.</td><td>
<table>
<tr><th>විස්තරය</th><th>ණය ශේෂය රු.</th><th>වර්තමාන තත්වය</th></tr>
<tr><td colspan="3">වැඩ තහනම් කරන නිලධාරීන්</td></tr>
<tr><td>එම්.යූ.එම්. මුන්සීර් මහතා (බලයලත් නිලධාරී)</td><td>107,526.00</td><td>2024.03.05 දින ගෙවා අවසන් කර ඇත.</td></tr>
<tr><td>එච්.කේ.ආර්. ඒ.ජයවර්ධන මහතා (බලයලත් නිලධාරී)</td><td>72,496.00</td><td>නිලධාරියාට විශ්‍රාම වැටුප ගෙවීම සඳහා කටයුතු කරමින් පවතින අතර, ණය ශේෂය විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත.</td></tr>
<tr><td colspan="3">සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්</td></tr>
<tr><td>කේ.ජී.චින්තක ජයමාල් - රියදුරු</td><td>96,283.00</td><td>ඇපකරුගෙන් අයකර ගනිමින් පවතී.

2024.06.31 දිනට අයවීමට ඇති ණය ශේෂය රු. 85,020.00කි.</td></tr>
<tr><td colspan="3">මිය ගිය නිලධාරීන්</td></tr>
<tr><td>අජිත් වීරසූරිය මහතා - කා.සේ.සේ.</td><td>54,757.22</td><td>ණය ශේෂය කපා හැරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.</td></tr>
</table>
</td></tr>
<tr><td>08</td><td>අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි.</td><td>අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවා ගැනීමක් සිදු කර නොමැත.</td></tr>
<tr><td>09</td><td>2017.09.20 දිනැති 2017 අංක 4 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු, කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.</td><td>කාර්ය මණ්ඩලය සම්බන්ධ තොරතුරු වාර්තාවක් කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු යොදා ඇත.</td></tr>
<tr><td></td><td colspan="2">දෙවන කොටස</td></tr>
<tr><td>01</td><td>2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.</td><td>2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු යොදා ඇත.</td></tr>
</table>

02	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතවී ඇත.
03	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	සැලසුම්ගත පුහුණු අවස්ථා සඳහා නිසි පරිදි පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කර ඇත.
04	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාචන මට්ටමේ අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ මතය තත්ත්වාගනනය කළ මතයක් වන අතර මෙම මතයට හේතු වූ කරුණු ඉදිරියේදී සිදු නොවීම සඳහා කටයුතු යොදා ඇත.
05	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම් බැරකම් ප්‍රකාශ ලබා නොදුන් නිලධාරීන්ගේ නාම ලේඛනයක් අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇත. අනෙකුත් සියලු නිළධාරීන් මේ වන විට සිය වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දී ඇත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 79

දෙපාර්තමේන්තුවේ නම :- පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

අනු අං.	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	නිවරදි කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය
	පළමු කොටස	
01.	සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පිංතාරු කර නොතිබිණි.	රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ අංක 36/92 (1) අනුව මෙම දෙපාර්තමේන්තුවේ සංචිත වාහන වල රාජ්‍ය ලාංඡන සලකුණු කර අවසන්ව ඇත.
02.	මු.රේ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබූ ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි.	මු.රෙ.94(1) අනුව ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට බැඳීම සීමා කර තිබුණද, අදාළ වර්ෂය සඳහා සැපයුම් හා සේවා වියදම් වෙනුවෙන් වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන අවස්ථා වලදී මු.රෙ. 94(2) යටතේ සලසා ඇති ප්‍රතිපාදන අනුව මෙලෙස බැරකම් වලට එළඹ ඇත.
	දෙවන කොටස	
01	සකස් කරන ලද මානව සම්පත් සැළැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	අයවැය ඇස්තමේන්තුව මගින් 2022 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදනය රු.1,000,000.00 කි. එම මුදල තුල දෙපාර්තමේන්තුව විසින් පුහුණු වැඩසටහන් සඳහා සකස් කරන ලද පුහුණු සැලැස්ම අනුව විධායක සහ විධායක නොවන නිලධාරින්, ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය වන පරිදි නිලධාරින් 1242 ක් සඳහා පුහුණු අවස්ථා ලබා දී ඇත. තවද, පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා එම ප්‍රතිපාදනය තුල ආවරණය කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් රු.180,000 ක අමතර ප්‍රතිපාදනයක් ද ලබාගෙන රු.1,180,000 මුළු ප්‍රතිපාදනය ආවරණය කර ඇත.
02	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	විගණකාධිපති විසින් විගණන මතය තත්ත්වාගණනය කර ඇත.

ටිරාන් අලස්

මහජන ආරක්ෂක අමාත්‍ය

මහජන ආරක්ෂක අමාත්‍යාංශය